**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය - 2017**

----------------------------------------------------------

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම

මණ්ඩලය විසින් අවසන්වරට පිළියෙළ කරන ලද 2015 හා 2016 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| ජංගම නොවන වත්කම් | 6 ,285,763,738 | 5 ,980,906,735 |
| ජංගම වත්කම් | 786,880,486 | 619,824,684 |
| මුළු වත්කම් | 7,072,644,224 | 6,600,731,419 |
| **හිමිකම්** | **1,137,450,817** | **1,116,964,929** |
| ජංගම නොවන වගකීම් | 3,810,940,996 | 4,010,224,408 |
| ජංගම වගකීම් | 2,124,252,410 | 1,473,542,083 |
| **මුළු හිමිකම් හා වගකීම්** | **7,072,644,223** | **6,600,731,420** |

| | | |
|---|---|---|
| ආදායම් | 3,051,546,983 | 2,307,597,003 |
| වියදම් | 3,042,059,852 | 2,272,756,898 |
| **අතිරික්තය** | **9,487,131** | **34,840,105** |

**2.2.1 මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම**

මුදල් අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනට නිකුත් කරන ලද වාර්ෂික වාර්තාව අනුව ජාතික පශු සම්පත් මණ්ඩලය මගින් ප්‍රතිණය ගිවිසුමට අනුව මහා භාණ්ඩාගාරයට එදිනට ගෙවිය යුතු ණය මුදල රු.5,226,174,301 ක් විය. තවද, 1971 අංක 38 දරණ මුදල් පනතේ 16(2) ඡේදය ප්‍රකාරව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් 2017 වර්ෂය තුලදී ණය ලබාගැනීමේ සීමාව රු.මිලියන 75 සිට රු.මිලියන 300 දක්වා වැඩි කර තිබූ අතර 2017 දෙසැම්බර් 31 දිනට රු.210,333,333 ක ණය මුදලක් රාජ්‍ය බැංකු වෙත ගෙවිය යුතුව පැවතුනි. 2015 හා 2016 වර්ෂවල විගණන වාර්තා මගින් පෙන්වා දී ඇති පරිදි අධිතෝලණ තත්ත්වයක් හා ද්‍රවශීලතා ගැටළු පැවතීම හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටළු ඇතිවීමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය වූ අතර වත්කම්වල කාර්යසාධනය ඉහළ නැංවීමකින් තොරව මණ්ඩලයේ ණය ප්‍රමාණය 2018 වර්ෂයේදී රු. මිලියන 600 දක්වා ඉහල නැංවීමට ඉල්ලුම් කර ඇති බවද නිරීක්ෂණය විය.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| 2009 අංක 9 දරන ජාතිය ගොඩනැංවීමේ බදු පනතේ 3:2 උප වගන්තිය | ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ ජාතිය ගොඩනැංවීමේ බදු වටිනාකම රු. 75,258 ක් අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 සැලසුම් කිරීම**

(අ) සංයුක්ත සැලැස්ම

(i) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට කලින් යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මේ පිටපත් අදාල පාර්ශවයන් වෙත යොමුකර නොතිබුණි.

(ii) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාරව, සංයුක්ත සැලැස්මට ඇතුළත් විය යුතු වර්තමානයේ ආයතනය සතුව පවතින සම්පත්, සංවිධාන ව්‍යුහය, සැලසුම් කාලසීමාව තුල ඉටුකල යුතු ඉලක්ක හා අරමුණු සම්බන්ධයෙන් කළමණාකරණ වගකීම හා මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ඩිලයිට්, වරලත් අලෙවිසැල්, කිරි ව්‍යාපෘති හා ප්‍රධාන කාර්යාලයීය අලෙවිසැල යන ව්‍යාපෘතීන් සම්බන්ධ තොරතුරු 2016 -2020 සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

------------------------

(i) සමාලෝචිත වර්ෂයේ අයවැය හා ප්‍රසම්පාදන සැලැස්ම තුල තොරතුරු තාක්ෂණික අංශය සඳහා රු. මිලියන 13ක ආයෝජනයක් වෙන් කර තිබූ නමුත් එමගින් අපේක්ෂිත කාර්යයන් 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ හඳුනාගෙන නොතිබුණි.

(ii) ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය 2017 වර්ෂයට අදාළව ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තාව තුළ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ 2017 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතීන් 16 කට අදාළව ඇස්තමේන්තුගත ආයෝජන වටිනාකම වූ රු.මිලියන 106.02 කින් රු.මිලියන 72.6 ක් වැය කල බව දක්වා තිබුණි. නමුත් ක්‍රියාකාරී සැලැස්ම තුළ එවැනි ව්‍යාපෘතීන් පුරෝකථනය කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂය සඳහා මණ්ඩලය විසින් ගොවිපල 31 ක් සඳහා පශු සම්පත් වල භෞතික ප්‍රගතිය දක්වමින් කාර්යසාධන වාර්තාවක් පිළියෙල කර තිබූ නමුත් ගොවිපලවල ප්‍රධාන වගාවක් වන පොල් හා අනෙකුත් වගාවන් හා ඉදිකිරීම් ආදීයේ ප්‍රගතියන්ද, ප්‍රධාන කාර්යාලය හා මණ්ඩලයේ පවතින ව්‍යාපෘතීන්ද ඇතුලත්ව සමස්ත ආයතනයට අදාලව පිළියෙල කරන ලද භෞතික හා මූල්‍ය ප්‍රගතිය දැක්වෙන කාර්යය සාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

### 3.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයට අදාලව මණ්ඩලය විසින් පිළියෙල කර 2017 ජූලි 12 දින විගණනය වෙත ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යය සාධන වාර්තා සැසඳීමේදී ගොවිපල 31 ක් යටතේ වූ ව්‍යාපෘති 10 කට අදාළව ක්‍රියාකාරකම් 294 ක් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ගොවිපල 21 ක ව්‍යාපෘති 07 කට අදාල ක්‍රියාකාරකම් 40 ක් 2017 වර්ෂය තුල සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණ අතර ක්‍රියාත්මක නොකිරීමට හේතුන් ද කාර්ය සාධන වාර්තාවේ අනාවරණය කර නොතිබුණි.

(ii) මණ්ඩලයේ වාර්ෂික ප්‍රගතිය පිළිබඳ පරීක්ෂාවේදී ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් ගොවිපල 23 කට හා ව්‍යාපෘති 09 කට අදාලව ක්‍රියාකාරකම් 63 ක ප්‍රගතිය සියයට එකත් සියයට 49 ත් අතර අගයන් ගෙන තිබූ අතර අදාල කාර්ය නිසි පරිදි ඉටු නොකිරීමට හේතුන් ද දක්වා නොතිබුණි.

(iii) ගොවිපොල 14 ක ව්‍යාපෘති 05 කට අදාලව ක්‍රියාකාරකම් 14 ක් 2017 වර්ෂයේ ඉටුකර තිබූ නමුත් එම ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ දක්වා නොතිබුණි.

(ආ) 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තිය හා 1975 පෙබරවාරි 14 දිනැති අංක 151 දරන ගැසට් පත්‍රයේ සංශෝධනයට අනුව මණ්ඩලය විසින් ඉටු කළ යුතු කාර්යන් තුල ඇතුලත් මස් පිණිස සතුන් මිලට ගැනීම සඳහා මධ්‍යස්ථාන පිහිටුවීම හා සතුන්ගේ කුණප සැපයීම පිණිස, ප්‍රාදේශීය ඝාතනාගාර පිහිටුවීම, ප්‍රවාහනය කිරීම සහ හඳුනා ගැනීම පිණිස මුද්‍රා තබන ලද කුණප ඝාතනාගාරවල සිට බලයලත් වෙළඳුන් වෙත ප්‍රවාහනය කිරීම යන කාර්යයන් මණ්ඩලය විසින් වර්තමානයේ ඉටු කරනු නොලැබේ.

## 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 පෙබරවාරි 11 දිනැති අංක අමප/16/0125/732/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ශ්‍රී ලංකා යුධ හමුදාව යටතේ පාලනය වූ කන්දකඩුව සහ ත්‍රිකෝණමඩු ගොවිපලවල් නැවත මණ්ඩලය වෙත පවරාගැනීමට තීරණය කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 ජුලි 08 දිනැති හා අංක අමප/15/0940/631/018-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මහවැලි සත්ව ව්‍යාපාරික සමාගම 2018 අගෝස්තු 15 දින දක්වාම මණ්ඩලය යටතට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණු ජාතිය ගොඩනැංවීමේ බදු වාර්තාව, එකතු කළ අගය මත බදු වාර්තාව හා ආර්ථික හා සේවා ගාස්තු වාර්තා වල දක්වා තිබුණු වර්ෂයේ මුළු විකුණුම් පිරිවැටුම පිළිවෙළින් රු.2,480,149,815, රු.2,400,170,372 හා රු.2,486,787,349 ක් ලෙස එකිනෙකට වෙනස් අගයන් දක්වා තිබුණද ඒ සඳහා සැසඳීම් වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) කන්තලේ උක් වගා භූමියේ අක්කර 1,000 ක ඉඩමක බඩ ඉරිගු ව්‍යාපෘතියක් වෙනුවෙන් නැගෙනහිර නවෝදය යටතේ චක්‍රීය අරමුදලක් ඇති කිරීමට 2007 ජුනි 28 දින මණ්ඩලය වෙත රු.මිලියන 37.55 ක් ලබා දී තිබුණි. එම ව්‍යාපෘතිය අසාර්ථක වීම හේතුවෙන් 2011 සැප්තැම්බර් 11 දින ඉඩම සීනි සමාගම වෙත පවරන අවස්ථාවේ බඩ ඉරිගු ව්‍යාපෘතිය යටතේ පැවති චක්‍රීය අරමුදලේ ඉතිරි මුදල් වන රු. 17,549,342 ක් මහ බැංකුවේ අදහස් දැක්වීම් හා 2007 ජුනි 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුව තිබුණද, එසේ සිදු නොකොට ඉන් රු. 13,295,637 ක් 2011 වර්ෂයේ සිට ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි.

(ඉ) වටිනාකම රු.11,555,012 ක් වූ මිලදී ගැනීම් හා ඉදිකිරීම් අවස්ථා 04 ක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**3.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 1.6 ශ්‍රේණිගත කිරීම අනුව මණ්ඩලය B ශ්‍රේණියේ ආයතනයක් වන අතර චක්‍රලේඛයේ 5.2.2.(අ) අනුව B ශ්‍රේණියේ ආයතනයක ප්‍රාග්ධන ආයෝජනය රු.මිලියන 2.5 ට වඩා සිදුවන ව්‍යාපෘති සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකල යුතු වුවත් රු. මිලියන 5.2 සිට රු. මිලියන 23.63 ක් දක්වා වූ ව්‍යාපෘති 16 ක් එලෙස ශක්‍යතා අධ්‍යයනයක් සිදුනොකර ආරම්භකර තිබුණි.

**3.4 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්**

කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ඉදිරිපත් කර තිබුණු 2017 දෙසැම්බර් 31 දිනට අදාළ ගොඩනැගිලි පිළිබඳ වාර්තාව අනුව ගොවිපල්වල පිහිටි සේවක නිල නිවාස 81 ක සේවකයින් පදිංචි නොවී නිශ්කාර්යව පවතින බවත්, ප්‍රයෝජනයට ගෙන නොමැති නිවාස නොවන ගොඩනැගිලි භූමි ප්‍රමාණය වර්ග මීටර 126,341 ක් බවත් නිරීක්ෂණය විය.

**3.5 ආර්ථික නොවන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය සඳහා මණ්ඩලය විසින් අලෙවි සැලසුම් පිළියෙල කර නොතිබූ අතර 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැළැස්ම තුළ අන්තර්ගත වී නොතිබූ රු.4,880,715 ක් වටිනා (උච්ච වායු උෂ්ණත්ව) (UHT) ඇසුරුම් ද්‍රව්‍ය ඒකක 239,000 ක් 2017 අගෝස්තු 09 දින ආනයනය කර තිබුණි. 2018 අගෝස්තු 14 දින වනවිටත් එම ඇසුරුම් ද්‍රව්‍ය භාවිතා කර නිෂ්පාදන බෙදාහැර තිබුණේ රු.302,523 ක් වටිනා ඒකක 14,814 ක් හෙවත් සියයට 6.1 ක් පමණක් වූ අතර මණ්ඩලයේ සැළසුම් දූර්වල වීම මත සම්පත් ඌන උපයෝජිතව පැවති බව නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලයේ පරිපාලිත සමාගමක් වන සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගමෙහි රක්නාගාර යන්ත්‍රයේ ධාරිතාවය ඒකක 19,600 ක් වන නමුත් වර්තමානයේ නිෂ්පාදනය ඒකක 10,000ක් පමණක් වූ අතර එම යන්ත්‍රය පූර්ණ ධාරිතාවයෙන් උපයෝජනය කළ හැකි පරිදි නවීකරණය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද මණ්ඩලයට පවරා ගැනීමට උපදෙස් ලබාදී ඇති තඹුත්තේගම පිහිටි මහවැලි සත්ව නිෂ්පාදන සමාගමේ ද ප්‍රධාන නිෂ්පාදනය කුකුළු පැටවුන් වුවද, මණ්ඩලය විසින් කිසිදු ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ඉඩමක් කුකුළු ගොවිපලක් සඳහා බදු පදනම මත ලබාගැනීමට 2017 අගෝස්තු 28 දින රු.8,938,260 ක ආයෝජනයක් කර තිබීම ගැටළු සහගත විය. 2017 සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හෝ ප්‍රාග්ධන අයවැය තුළ මණ්ඩලය විසින් කුකුළු ගොවිපලක් ආරම්භ කිරීම සඳහා ඉදිරි දැක්මක් නොතිබූ අතර බදු ගෙවා ලබාගත් මෙම ඉඩම ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් නොවන බවද එම ප්‍රදේශය භාර මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරිවරයාගේ ලිපිය අනුව නිරීක්ෂණය විය. ඒ අනුව ආයතනය විසින් මෙබඳු ගනුදෙනුවක් සිදුකිරීම විගණනයේදී ගැටළු සහගත විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ඌරන් හා බැටළුවන් ආනයන ව්‍යාපෘති සඳහා පුවත්පත් දැන්වීම් ලෙස රු.115,870 ක් වැයකර ලංසු කැඳවීමට කටයුතු කර තිබූ නමුත් එම ව්‍යාපෘති අත්හැර දමා තිබීම හේතුවෙන් පුවත්පත් දැන්වීම් සඳහා දරන ලද වියදම නිෂ්පල වියදමක් වී තිබුණි.

**3.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 5:2:1 අනුව මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක පුරප්පාඩුවක් ඇති වූ විට එම තනතුර නොපමාව පිරවීමට කටයුතු කළ යුතුය. එහෙත් මණ්ඩලයේ සංවිධාන ධුරාවලියේ ඉහලම මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු එනම් සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරු 02 ක් හා සහකාර සාමාන්‍යාධිකාරී තනතුරු 02 ක් ලෙස තනතුරු 5ක් මාස 11සිට වසර 02 මාස 08 ක් දක්වා වූ කාල පරාසයක් තුළ පුරප්පාඩුව පැවති අතර එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබූ අතර තවදුරටත් ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සාමාන්‍යාධිකාරී තනතුර

ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 9:1 ප්‍රකාරව, විශ්‍රාමික නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවීමට අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගැනීම අනිවාර්ය වන අතර 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.10 ඡේදය ප්‍රකාරව, කොන්ත්‍රාත් පදනම මත හෝ අනියම් පදනම මත ඕනෑම බඳවාගැනීමක් සඳහා හා ගෙවීම් කිරීමට මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ පූර්ව අවසරය ලබා ගැනීම අනිවාර්ය කර තිබුණි. එහෙත් අධිකාරිය විසින් ඊට අනුකූල නොවන ලෙස 2018 ජනවාරි 16 දින සිට හිටපු සාමාන්‍යාධිකාරීවරයා මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී තනතුරේ වැඩ බැලීමට පත් කර තිබූ අතර වැඩ බැලීමේ දීමනා ලෙස මාසිකව රු.110,000 ක්ද, වෘත්තීය දීමනා රු.15,000 ක් ද හා රක්ෂණ දීමනා ලෙස මාසිකව රු.2,000 ක්ද වශයෙන් එකතුව රු.127,000 ක් හා පෙර ලබාදී තිබූ වරප්‍රසාද වන වාහනයක් (පෞද්ගලික පාවිච්චියට කිලෝමීටර් 960 කට ඉන්ධන), නිවසක් හා සේවකයින් දෙදෙනෙක් ද ලබාදී තිබුණි. කෙසේ වුවද, සාමාන්‍යාධිකාරිවරයාගේ කොන්ත්‍රාත් කාලය 2019 ජනවාරි 15 දිනට අවසන් වූ නමුත් මෙම තනතුර සඳහා ස්ථිර නිලධාරියකු පත් කර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් මෙම වාර්තාවේ දින වන විටත් ගෙන නොතිබුණි.

(ආ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරු සඳහා වැඩ බැලීමට පත්කිරීම

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 12.2.6 වගන්තිය ප්‍රකාරව, අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පශු සම්පත් හා වැවිලි සංවර්ධන) තනතුර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංස්ථා හා මෙහෙයුම්) තනතුර සඳහා සහකාර සාමාන්‍යාධිකාරී තනතුරු දරන නිලධාරීන් දෙදෙනෙකු 2017 ඔක්තෝබර් 17 දින වැඩ බැලීමට පත්කර තිබුණි. කෙසේ වුවද, වැඩ තහනමට ලක්ව තිබූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංස්ථා හා මෙහෙයුම්) 2017 දෙසැම්බර් 12 දින සිට නැවත සේවයට වාර්තා කර තිබූ නමුත් එම තනතුරේ වැඩ බැලීමේ තනතුර අවලංගු නොකර 2017 දෙසැම්බර් 12 දින සිට 2018 අගෝස්තු 31 දක්වා රු. 36,000 ක් වැඩ බැලීමේ දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.

(ඇ) දිගින් දිගටම පැවති තනතුරු පුරප්පාඩු හේතුවෙන් ගිණුම් අංශය අකර්මණ්‍ය වී තිබීම

ගිණුම් අංශයෙහි වූ ප්‍රධාන විධායක තනතුරු තුනෙහි නිලධාරීන් 04 දෙනකු සේවයේ යෙදිය යුතු නමුත්, 2016 වර්ෂයේ සිට කළමනාකරු හා සහකාර කළමනාකරු තනතුරු දෙකද මාස 11ක සිට සහකාර සාමාන්‍යාධිකාරි (මූල්‍ය) තනතුරද පුරප්පාඩුව පැවති බැවින්, 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 සැප්තැම්බර් 15 දින දක්වාම ඉදිරිපත් කර නොතිබූ අතර මූල්‍ය පාලනය දුර්වල වීමටද එය හේතු වී තිබුණි.

(ඇ) සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන)

2016 ජනවාරි සිට පුරප්පාඩුව පවතින මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) තනතුර සඳහා බඳවා ගැනීමට 2017 මාර්තු 04 දින ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකර තිබූ අතර ඒ අනුව ලැබී තිබූ අයදුම්පත් 18 කට අදාලව අයදුම්කරුවන් සඳහා 2017 මැයි 31 දින සම්මුඛ පරීක්‍ෂණ පවත්වා තිබුණි. එහෙත් විගණන දිනය වූ 2018 සැප්තැම්බර් 04 දින දක්වාම එම තනතුරට බඳවාගෙන නොතිබූ අතර මෙම තනතුර පුරප්පාඩු වී වසර 02 මාස 8 ක කාලයක් ගතවීම, මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දින වන විට පවතින ප්‍රධාන විධායක තනතුරු 105 කින් 42 ක් ම පුරප්පාඩු වීමටද හේතුවක් වූ බව නිරීක්ෂණය කෙරේ.

(ඉ) අධීක්‍ෂණ හා මෙහෙයුම් කළමනාකරු යන තනතුර 2015 දෙසැම්බර් මස 01 දින සිට ද, අධීක්‍ෂණ හා මෙහෙයුම් සහකාර කළමනාකරු තනතුර මණ්ඩලයේ බඳවා ගැනීම් පටිපාටිය සකස් කල දිනය වූ 2011 අගෝස්තු 25 දින සිට 2018 අගෝස්තු 31 දින දක්වා පිළිවෙලින් වර්ෂ 2 මාස 9ක් හා වර්ෂ 7ක සිට පුරප්පාඩු වී පැවතුණි.

(ඊ) බඳවා ගැනීමේ පරිපාටිය අනුව නියමිත කඩඉම් විභාග සඳහා පෙනී නොසිට උසස් වීම් ලබාදීම.

2011 අගෝස්තු 24 දින ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් සම්මත කරගෙන තිබූ සේවක බඳවාගැනීමේ පටිපාටිය අනුව, කළමනාකරණ මට්ටමේ පළවන ශ්‍රේණිය දක්වා සියලු සේවකයින්ට උසස් වීම් හා වැටුප් වර්ධක සඳහා කඩඉම් විභාගය සමත්වීම අනිවාර්ය වේ. නමුත් සේවක බඳවාගැනීමේ පටිපාටිය ස්ථාපිත කරන විට කළමනාකරණ සේවයේ සිටි නිලධාරීන් 7 දෙනකු සහකාර සාමාන්‍යාධිකාරී තනතුර දක්වා උසස්වීම් ලබා ඇත්තේ ඉහත සඳහන් කඩඉම් විභාග වලින් සමත් වීමෙන් තොරව වන බව විගණනයේදී අනාවරණය විය. තවද ජොෂ්ඨ, තෘතියික මට්ටමේ තනතුරු 11ක නිලධාරීන් 43 දෙනෙකු හා ද්විතියික මට්ටමේ තනතුරු 2ක නිලධාරීන් 12 දෙනකු පශ්චාත් අධ්‍යාපන සුදුසුකම් හා අවශ්‍ය පළපුරුද්ද නොමැතිව බඳවා ගෙන තිබුණි.

(උ) බඳවා ගැනීම් පටිපාටිය උල්ලංඝනය කරමින් බඳවා ගැනීම් සිදුකිරීම.

2012 ජනවාරි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා නියැදි පරීක්ෂාවට අනුව, මණ්ඩලයට බඳවාගෙන තිබූ ජොෂ්ඨ, තෘතියික හා ද්විතියික මට්ටමේ නිලධාරීන් 43 දෙනෙකු අතුරින් නිලධාරීන් 19 දෙනෙකුට එනම් සියයට 44 කට අවශ්‍ය වෘත්තීය හෝ ප්‍රායෝගික සුදුසුකම් නොමැතිව බඳවා ගැනීමට කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය. ජොෂ්ඨ මට්ටමේ නිලධාරීන් තිදෙනෙකුගේ සේවය වෘත්තීය හා ප්‍රායෝගික සුදුසුකම් නොමැති වීම මත අවසන් කර තිබූ අතර නිලධාරීන් 18 දෙනෙකු 2017 ඔක්තෝබර් 25 දින වන විට ඉල්ලා අස්වී තිබුණු අතර ඔවුන්ගෙන් නිලධාරීන් 07 දෙනෙකුට ද වෘත්තීය සුදුසුකම් නොතිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව, බඳවාගත් නිලධාරීන් 22 ක් පමණක් මෙම වාර්තාවේ දින වන විට සේවය ලබාදෙන නමුත් එයින් ද 9 දෙනෙකු, බඳවාගැනීමේ පටිපාටිය අනුව තිබිය යුතු ප්‍රායෝගික සුදුසුකම් නොමැතිව බඳවා ගෙන තිබුණි. ඒ අනුව, මෙම ආයතනය දිගින් දිගටම බඳවා ගැනීම් පටිපාටිය උල්ලංඝනය කරමින් කටයුතු කරන බව විගණනයේදී නිරීක්ෂණය විය.

**3.7 වාහන උපයෝජනය**

මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, මණ්ඩලය සතුව වාහන 185 ක් පැවති අතර වාහන පාලනය හා උපයෝජනය සම්බන්ධයෙන් සිදුකල නියැදි පරීක්ෂාවට අනුව පහත සඳහන් නිරීක්ෂන කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ රෙගුලාසි 1642 අනුව හදිසි අනතුරක් සිදුවූ වහාම එම අනතුර පොලිසියට වාර්තා කලයුතු විය. එහෙත් වාහන අනතුරු දහයක් අතුරින් අනතුරු පහක්ම පොලිසියට වාර්තා කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 104(3) අනුව, අනතුර සිදුවී දින 7ක් ඇතුළත ප්‍රාරම්භක වාර්තාවක් හෝ මුදල් රෙගුලාසි 104(4) අනුව අවසන් වාර්තාව හෝ පිළියෙළ කළ යුතු වුවත්, වාහන අනතුරු දහයක නියැදි පරීක්ෂාවට අනුව එම වාර්තා පිළියෙළ කර නොතිබූ අතර සිදුවූ අලාභයන් හඳුනාගෙන වගකිවයුතු පුද්ගලයින්ගෙන් එම අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 මැයි 25 දිනැති අංක 1/2015 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.1. වගන්තියේ විධිවිධානවලට පටහැනි ලෙස 1989 ජුලි 13 දිනැති අංක 29/89 දරන පශු සම්පත් මණ්ඩලයේ සභාපති සඳහා ඉන්ධන සීමා කිරීමක් නොමැති බවද, සහකාර කළමණාකරු තනතුරු දරන නිලධාරීන්ට හා ඉහළ සියලුම කළමණාකරුවන්ට පුද්ගලික ධාවන සඳහා පමණක් සීමාව කිලෝමීටර 960 ආසන්න ලෙස ලීටර් 137ක් (ලීටර් 1ට කිලෝමීටර 7) ක් ලෙසද දක්වා තිබුනි. තවද එම කළමණාකරුවන් අතර එච්එම් 1-1 බාණ්ඩයට පහළ නිලධාරීන් ද ඇතුලත්ව තිබූ නමුත්, මෙසේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ විධිවිධාන අභිබවා කටයුතු කිරීමට එම දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඈ) 2015 මැයි 25 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 ඡේදය ප්‍රකාරව සභාපති සඳහා රාජකාරී හා පුද්ගලික පාවිච්චිය සඳහා මාසිකව ලබාදෙනු ලබන ඉන්ධන සීමාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවන්හි ද රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවද, එලෙස අනුමැතියක් ලබා නොගෙන ඉන්ධන සීමාවක් රහිතව වාහන ප්‍රයෝජනයට ගෙන තිබුණි.

(ඉ) සංචිත වාහනයක් ලෙස පවතින රථයක් 2018 ජුලි 20 දින මණ්ඩලයේ සභාපති විසින් රැගෙන ගොස් තිබූ අතර 2018 අගෝස්තු 01 දින දක්වා කිලෝමීටර 2,483ක් ධාවන සටහන්වල ඇතුලත් නොකර ධාවනය කර තිබුණි. 2018 අගෝස්තු 03 දින සිට එම රථය නැවත අමාත්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු වෙත භාර දී තිබූ අතර මෙම රථය මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම වෙත ලබාදී ඇති බවට මණ්ඩලය විසින් දන්වා තිබූ නමුත් එය තහවුරු කිරීමට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

**3.8 වෙළෙඳපොළ කොටස**

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ හා මහ බැංකු වාර්ෂික වාර්තා අනුව සමාලෝචිත වර්ෂය තුල රටෙහි සමස්ත කිරි නිෂ්පාදනයෙන් මණ්ඩලයේ දායකත්වය සියයට 3.8 ක්ද, පොල් නිෂ්පාදනයෙන් සියයට 0.6 ක්ද හා කුකුළු නිෂ්පාදනයෙන් සියයට 13.5 ක්ද වූයෙන් දායකත්වය ඉතා පහළ මට්ටමක පැවතුණි.

**4. තිරසාර සංවර්ධනය**

**4.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරණ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ "වසර 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් තම විෂයපථය යටතට

ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. ඒ හේතුවෙන් මණ්ඩලයේ විෂයය පථයට අදාල තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්දිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

2018 ජනවාරි 30 දිනැති අංක 493 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි අභ්‍යන්තර විගණන කළමනාකරු, කළමනාකරු මූල්‍ය තනතුරේ වැඩ ආවරණය සඳහාද පත්කර ඇති බැවින් අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කිරීම පමාවීම, අභ්‍යන්තර විගණන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම වැනි කාර්යයන් ඉටු කිරීම අකර්මණ්‍ය වී ඇති බව නිරීක්ෂණය විය.

### 5.2 ප්‍රසම්පාදනයන් හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 5.2.1 ප්‍රසම්පාදනයන්

(අ) ප්‍රසම්පාදන සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2006 රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) ප්‍රකාරව මණ්ඩලය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

(ii) 2006 රජයේ ප්‍රසම්පාදන අත්පොතේ 4.2.3 ඡේදය ප්‍රකාරව, ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙළ කල යුතු වුවත් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලස්ම තුල ඇතුලත් මිල දී ගැනීම් සඳහා නිශ්චිත කාලසීමාවක් දක්වා නොතිබූ අතර සියලුම මිලදී ගැනීම් සඳහා ආරම්භක දිනය 2017 ජනවාරි 01 හා අවසාන දිනය 2017 දෙසැම්බර් 31 ලෙස දක්වා තිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1(අ) ඡේදය අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙළ කිරීම, 4.3.2 ඡේදය අනුව එය අනුමත කිරීම, 4.3.3 ඡේදය අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කිරීම හා යාවත්කාලීන කිරීම සිදුකර නොතිබුණි.

(iii) ගොවිපල 22 ක අයිතම 157 ක් මිලදී ගැනීම සඳහා අයවැයගත කර තිබූ වටිනාකම රු. මිලියන 360.34 ක් ද ප්‍රධාන කාර්යාලයේ අංශ 4 ක අයිතම 6 ක් සඳහා රු.මිලියන 5.18 ක් ද හා ෆාම් ෂොප් අංශයට අයිතම 14 ක් මිලදී ගැනීමට රු. මිලියන 1.93 ක් ද වෙන්කර තිබූ නමුත් ඒවා ප්‍රසම්පාදන සැලැස්මේ දක්වා නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුල ගොවිපල 8 ක අයිතම 16 ක හා ප්‍රධාන කාර්යාලයේ අංශයක අයිතමයක් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුලත් වටිනාකම රු.මිලියන 41.03 ක් හා අයවැයගත වටිනාකම වන රු. මිලියන 45.95 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) 2017 ඔක්තෝබර් 01 දින සිට 2018 සැප්තැම්බර් 30 දින දක්වා ගවයින් සඳහා රු.508,793,160 ක වටිනාකමින් යුත් ආහාර මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 2.14 .1 හා 2017 මාර්තු 15 දිනැති අතිරේක 33 පරිදි රු.මිලියන250 ඉක්මවා මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත කටයුතු කල යුතු වුවද ඊට පටහැනිව මණ්ඩලයේ ප්‍රසම්පාදන කමිටුව මගින් ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණි. 2017 ඔක්තෝබර් 01 සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා නියදි පරීක්ෂාවට අනුව, එම මිලදී ගැනීම් සඳහා රු. 55,827,475 ක් වැය කර තිබුණද ආහාර ද්‍රව්‍යවල ප්‍රමිතිය තත්ත්ව පාලන පරීක්ෂාවන් මගින් සහතික කර ගෙන නොතිබුණි.

(ඇ) 2017 වර්ෂය තුලදී එකතුව රු.95,442,840 ක වටිනාකමකින් යුතු ස්ථාවර වත්කම් ඉදිකිරීමට හා රු.70,955,950 ක වටිනාකමින් යුතු වත්කම් මිලදී ගැනීම් 10 කට අදාල ලිපිගොණු පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 4.3 ප්‍රකාරව රු.47,322,950 ක් වටිනා කොන්ත්‍රාත් 9ක් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 5.4.8 හා 8.9.3 ප්‍රකාරව රු.9,276,427 ක් වටිනා කොන්ත්‍රාත් 5 ක් සඳහා කාර්යයසාධන සුරක්ෂණයක්, ප්‍රතිග්‍රහන ලිපියක් හා ලිඛිත ගිවිසුමක් අත්සන් කර නොතිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 5.6 ප්‍රකාරව ලංසු කැඳවීමට පෙර පිරිවිතර පිළියෙල කල යුතු වුවත් රු. 439,975 කට අයිස්ක්‍රීම් යන්ත්‍ර දෙකක් මිලදී ගැනීමට අදාල පිරිවිතර පිළියෙල කර නොතිබූ අතර රු. 1,733,602 ක මුදලකට ජංගම විදුලි වැටවල් 08 ක් මිලදී ගැනීම හා රු. 5,366,123 කට සිසිල් කාමර දෙකක් ඉදිකිරීම සඳහා පිරිවිතර අසම්පූර්ණව පිළියෙල කර තිබුණි. තවද ඉහත දක්වා ඇති විදුලි වැටවල් මිලදී ගැනීමට අදාලව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 7.11.1 ප්‍රකාරව ලංසු ඇගයීමේ වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

(iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ ඡේද අංක 8.12.3 ප්‍රකාරව ස්ථාන භාර නිලධාරී විසින් භාණ්ඩ ලැබුණු බවට හා ඒවා නියමිත පිරිවිතර වලට අනුකූල බවට සහතිකයක් නිකුත් කල යුතු නමුත් රු. 3,037,850 කට සත්ව ආහාර මිශ්‍ර කිරීමේ යන්ත්‍රයක් මිලදී ගැනීමේදී හා රු. 1,733,602 ක (බදු සහිත) මුදලකට ජංගම විදුලි වැටවල් 08 ක් මිලදී ගැනීමේදී එසේ සහතිකයක් නිකුත් කිරීමෙන් තොරව ගෙවීම් කර තිබුණි.

(ඈ) ගොවිපල දෙකක කුකුල් මස් සැකසීමේ ව්‍යාපෘතියක් සඳහා රු. 5,366,123 කට සිසිල් කාමර දෙකක් ඉදිකිරීමට හා රු. 16,591,487 කට බ්ලාස්ට් ෆ්‍රීසර දෙකක් සවිකර ගැනීම සඳහා ප්‍රසම්පාදනයේ එකතු වටිනාකමින් සියයට 20 ක අත්තිකාරම් වන රු.4,391,522 ක් 2017 මැයි 17 දින ගෙවා තිබුණි. නමුත් ගිවිසුමේ ව්‍යාපෘතිය නිම කලයුතු දිනය දක්වා නොතිබූ අතර අත්තිකාරම් ලබාගැනීමේදී ඉදිරිපත් කර ඇති අත්තිකාරම් සුරක්ෂණය 2017 සැප්තැම්බර් 30 දිනට කල්පිරුනු නමුත් එක් ගොවිපලක මෙම ඉදිකිරීම එදිනටත් අවසන් කර නොතිබුණි.

**5.2.2 ප්‍රමාද වූ ව්‍යාපෘති**

--------------------

සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 10.98 ක් වැයකර මහබෙරියතැන්න ගොවිපලට කුකුල් මස් සැකසීම සඳහා අවශ්‍යවන සිසිල් කාමරය හා බ්ලාස්ට් ෆ්‍රීසරයට සම්බන්ධ උපාංග සපයාගෙන තිබූ නමුත්, සවිකිරීම් කටයුතු සිදුකර නොතිබීම හේතුවෙන් කුකුල් මස් සැකසීමේ ව්‍යාපෘතිය 2018 සැප්තැම්බර් 10 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

**5.3 අයවැය පාලනය**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 අනුව, මූල්‍ය වර්ෂය ආරම්භ වීමට තෙමසකට පෙර කෙටුම්පත් අයවැය අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඉදිරිපත් කර ඇත්තේ මාස 4ක් ප්‍රමාදව 2017 ජනවාරි 31 දිනදීය. ඒ අනුව චක්‍රලේඛයේ 5.2.5 ඡේදයට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අදාළ වර්ෂය ආරම්භ වීමට දින 15 කට නොඅඩු කාලයක් තුළ අදාල ආයතන වෙත ඉදිරිපත් කල යුතු වර්ෂයේ අයවැය ලේඛණය ද ප්‍රමාද වී ඉදිරිපත් කර තිබූ අතර චක්‍රලේඛයේ 5.2.1 ඡේදය ප්‍රකාරව අයවැයගත ශේෂ පත්‍රයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**5.4 නොවිසඳී ඇති විගණන ඡේද**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1974 හා 1992 යන වර්ෂවල සිට මණ්ඩලය විසින් පවත්වාගෙන එන ගොවිපල 24 කට අයත් ඉඩම්වල අයිතිය විධිමත් පරිදි පවරා ගැනීමකින් තොරව එම ඉඩම්වල 2016 වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට රු. 194,565,192 ක් වටිනා ගොඩනැගිලි හා රු. 701,358,733 ක් වටිනා ව්‍යුහයන් ඉදිකර තිබුණි. එහෙත් 2017 දෙසැම්බර් 31 දින වන විටද එම ඉඩම් පවරාගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබූ අතර ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂන් සභාවේ මන්දගාමී තත්ත්වය හේතුවෙන් ගැසට් මගින් අයිතිය ලබා දීම ප්‍රමාද වී ඇති බව පිළිතුරු ලෙස දන්වා තිබුණි.

(ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5(2) ඡේදය ප්‍රකාරව ව්‍යාපෘති ක්‍රියාකාරි සැලැස්මේ අන්තර්ගත විය යුතු පහත සඳහන් කරුණු ඇතුළත් කර නොතිබුණි.

- (i) ආයතනයේ කිරි ව්‍යාපෘතිය, ෆ්‍රැන්චයිස් ව්‍යාපෘතිය, ඩිලයිට් ව්‍යාපෘතිය හා ෆාම් ෂොප් ව්‍යාපෘතීන් හා ප්‍රධාන කාර්යාලයේ ක්‍රියාකාරකම්.
- (ii) වාර්ෂික අයවැය ලේඛනයේ ඇතුළත් විය යුතු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- (iii) ණය ආපසු ගෙවීමේ සැලැස්ම
- (iv) යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තරය

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මිලදී ගැනීම් පාලනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම. |

| | | |
|---|---|---|
| (ආ) | වාහන පාලනය | (i) චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල නොවී නිලධාරීන්ට වාහන අනුයුක්ත කිරීම හා දීමනා ගෙවීම් කිරීම.<br><br>(ii) දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම.<br><br>(iii)වාහන ලොග් පොත්,වාහන ලේඛන යාවත්කාලීන කර නොතිබීම වාහන අනතුරු සම්බන්ධ ලේඛණයක් පවත්වා නොතිබීම.<br><br>(iv)වාහන සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් සිදු නොකිරීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | බඳවා ගැනීම් පටිපාටියට අනුගත නොවී බඳවා ගැනීම් සිදුකිරීම හා පුරප්පාඩු සඳහා බඳවාගැනීමට කටයුතු නොකිරීම |